**ඇල්පිටිය ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දින ද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ජුනි 14 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

#### (අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ඉකුත් වර්ෂයේ රු.1,803,186 ක් වැය කර නිමකරන ලද ගොඩනැගිලිවල වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ රු.34,900 ක් වූ අදාහනාගාර උපකරණවල වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂය තුළ නිම කරන ලද කර්මාන්ත වලට අදාළව ගෙවිය යුතු රු.173,295 ක් වූ රැඳවුම් මුදල තැන්පත් ගිණුමට ගිණුම් ගතකර නොතිබුණි. | තැන්පත් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iv) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.7,649,482 ක දායක මුදල ගිණුම්ගත කර නොතිබුණි. | ගෙවිය යුතු මුදල් ගිණුම් ගත කළ යුතු වේ. | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් විමසීම් කර පිළිතුරු ලද පසුව නිවැරදි කරමි. |
| (v) | සමාලෝචිත වර්ෂයට අදාළව විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. | විගණන ගාස්තු ප්‍රතිපාදන වෙන් කළ යුතු වේ. | 2019 වර්ෂයේදී විගණන ගාස්තු සඳහා වෙන් කිරීම් සිදු කිරීමට කටයුතු කරමි. |

**(ආ) නොසැසඳුනු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු.26,435,185 ක් වූ ගිණුම් විෂයයන් 06 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර, වෙනස්කම් දක්නට ලැබුණු අතර, නිරීක්ෂණය වූ අසමානතාවල ශුද්ධ එකතුව රු.1,775,086 ක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

(i) **ලැබිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වසර තුනක සිට ඉදිරියට ගෙනෙමින් පවතින බැකෝ යන්ත්‍ර ආදායම රු.208,280 ක් හා පොල බදු ආදායම රු.18,537 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු ආදායම් අයකර ගතයුතු වේ. | ආදායම් අයකිරීම සම්බන්ධයෙන් දිගින් දිගටම දැනුවත් කර ඇත. ඉදිරියේ දී අයකර ගැනීමට කටයුතු කරමි. |

(ii) **ගෙවිය යුතු ගිණුම්**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ඉකුත් වර්ෂවල නිම කර තිබූ සංවර්ධන ව්‍යාපෘති 08 ක් සඳහා ගෙවිය යුතු එකතුව රු.1,514,423 ක් වර්ෂය අවසාන වනවිටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගෙවිය යුතු මුදල් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | මෙම ව්‍යාපෘති ඉදිරියේ දී ක්‍රියාත්මක කිරීමට නියමිතව ඇත. |

**(ඇ) විගණනය සඳහා සාක්ෂි නොවීම**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.104,766,698 ක් වූ ස්ථාවර වත්කම් සහ එකතුව රු.488,912 ක් වූ තොග සම්බන්ධයෙන් විගණනයේ දී | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | |
|---|---|
| සතුටුදායක ලෙස පරික්ෂා කිරීමට නොහැකි විය. | ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. |

**1.4 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| නීති,රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/ 2002/ 02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | සභාව සතු රු.1,285,492 ක් වටිනා පරිගණක, උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. | චක්‍රලේඛ විධි විධාන ප්‍රකාර කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.25,251,341 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.14,664,054 ක් විය.

**2.2 මූල්‍ය පාලනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් පවත්වාගෙන යනු ලබන කර්මාන්ත ජංගම ගිණුමේ රු.1,248,008 ක් හා පොදු ජංගම ගිණුමේ රු.3,663,036 ක සාමාන්‍ය මාසික ශේෂයක් පැවැති අතර 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 131 වගන්තිය ප්‍රකාරව අතිරික්තව ඇති මුදල ආයෝජනය කිරීමෙන් සභාවට ලබා ගත හැකිව තිබූ ආදායමක් ලබා ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | පනත ප්‍රකාරව මුදල් ආයෝජනය කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |

**2.3 ආදායම් පරිපාලනය**

**2.3.1 ඇස්තමේන්තුගත ආදායම, බිල්කළ ආදායම,රැස්කළ ආදායම හා හිඟ ආදායම**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්,රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 ඇස්තමේන්තු ගත ආදායම | 2018 බිල්කළ ආදායම | 2018 රැස්කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2017 ඇස්තමේන්තු ගත ආදායම | 2017 බිල්කළ ආදායම | 2017 රැස්කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 3,077,000 | 3,193,888 | 1,648,687 | 13,560,759 | 3,153,000 | 3,114,307 | 2,065,298 | 11,664,450 |
| කුලී | 2,060,000 | 2,059,200 | 2,408,550 | 2,958,117 | 2,060,000 | 2,059,200 | 1,267,448 | 3,164,902 |
| බලපත්‍ර ගාස්තු | 900,000 | 977,459 | 906,965 | 93,054 | 900,000 | 983,270 | 991,430 | 22,560 |
| වෙනත් ආදායම් | 12,500,000 | 24,237,553 | 17,500,000 | 21,442,450 | 12,500,000 | 12,500,000 | 8,469,773 | 14,703,978 |
| | 18,537,000 | 30,468,100 | 22,464,202 | 38,054,380 | 18,613,000 | 18,656,777 | 12,793,949 | 29,555,890 |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යය සාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ අය කළයුතු මුළු ආදායම රු.60,023,990 ක් වුවද, වර්ෂය තුළ රැස්කළ මුළු ආදායම රු.22,464,202 ක් වීම නිසා වර්ෂය අවසානයට රු.38,054,380 ක හිඟ ශේෂයක් පැවැතුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | ඉදිරියේ නිවැරදි කිරීමට කටයුතු කරමි. |

### 2.3.3 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ අය කළයුතු මුළු ආදායම රු.14,858,338 ක් වුවද, වර්ෂය තුළ මුළු අයවීම් රු.1,648,687 ක් වීම නිසා වර්ෂය අවසානයට රු.13,560,759 ක හිඟ ශේෂයක් පැවතුණි. | හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී වරිපනම් හිඟය අඩු කර ගැනීමට පියවර ගනිමි. |

### 2.3.4 කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ රු.5,224,102 ක් අයවිය යුතුව තිබුණ ද, වර්ෂය තුළ මුළු අයවීම් රු.2,408,550 ක් වීමෙන් වර්ෂය අවසානයට තවදුරටත් රු. 2,958,117 ක හිඟ ශේෂයක් පැවතුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු වෙනුවෙන් රු.17,998,134 ක් හා උසාවි දඩ වෙනුවෙන් රු.3,444,316 ක් ලැබිය යුතුව තිබුණි. | ලැබිය යුතු ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යයසාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 03 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පනවා තිබුණ අතුරු ව්‍යවස්ථාව අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථාවට අනුව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ආ) තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ, තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභාබල ප්‍රදේශයේ මහජනතාවගේ වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන සඳහා වන දීර්ඝකාලීන සැලසුම් සකස් කර ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවිය යුතු වේ. | බල ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවීමට ඉදිරියේ දී සැලැස්මක් සකස් කරමි. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ පුස්තකාල 07 ක අස්ථානගත වූ පොත් 1097 ක රු.101,007 ක් වූ වටිනාකම සම්බන්ධයෙන් මු.රෙ.103 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අස්ථානගත වූ පොත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත තනතුරුවල පැවැති පුරප්පාඩු තනතුරු 20 ක් සම්පූර්ණ කර ගැනීමටත් 07 ක් වූ අතිරික්ත සේවක සංඛ්‍යාව විධිමත් කර ගැනීමටත් කටයුතු කර නොතිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට හා අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරමි |

**3.4 වත්කම් කළමනාකරණය**

**3.4.1 වත්කම් ලේඛනගත නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි 57 ක් නිවැරදිව හඳුනා ගෙන ලේඛනගත කර නොතිබූ අතර ඒවායේ දේපල තක්සේරු කර වටිනාකම් හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් ගොඩනැගිලි හා දේපල නිවැරදිව හඳුනා ගෙන වටිනාකම් තක්සේරු කිරීමට කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂයේ දේපල සමීක්ෂණයක් සිදු කරමින් පවතී. |

**3.4.2 වාර්ෂික තොග සමීක්ෂණ**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඇල්පිටිය ළමා උද්‍යානයේ පවතින භාණ්ඩ ලේඛනගත කර නොතිබූ අතර එම භාණ්ඩ භාරව භාරකරුවෙකු නොසිටිම නිසා භාණ්ඩවල ආරක්ෂාව හා නඩත්තු කටයුතු | සභාවේ දේපල ආරක්ෂාව හා නඩත්තු කටයුතු විධිමත් කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |

අක්‍රීය තත්ත්වයේ පැවතුණි. උද්‍යානයට සපයා තිබූ විදුලි පද්ධතියද මේ නිසා අනාරක්ෂිතව පැවතුණි

**3.4.3 වාහන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ධාවනය තත්ත්වයේ නොපැවති වාහන 03 ක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව අපහරණය කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වියදම් විෂයයන් 08 ක රු.22,677,373 ක ඉතිරිවීම් තිබූ අතර, එම අගයන් සියයට 21 සිට සියයට 75 අතර පරාසයක පැවැතුණි. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේ දී මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරමි. |
| (ආ) | ආදායම් විෂයයන් 03 ක අහිතකර විචලනයන්ගේ එකතුව රු.18,380,003 ක් වූ අතර, එම අගය සියයට 25 ත් 55 ත් අතර පරාසයක විය. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේ දී මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරමි. |

**4.2 අභ්‍යන්තර විගණනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි විධිවිධාන හා පළාත් පාලන කොමසාරිස් (දකුණු පළාත) ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක : දපපා/යහ/01/නා.ව.ලේ දරන චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණන වැඩසටහන පිළියෙල කිරීමේදී විගණකාධිපතිගෙන් විමසීම් කර නොතිබුණු අතර, ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර විගණන වාර්තාවල පිටපතක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාර කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |